Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

නම : ............................................ **ඉතිහාසය** කාලය : පැය 2යි.

**සැලකිය යුතුයි:**
❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

❖ අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(1) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී ක්‍රි.ව. දොළොස්වන සියවසට අදාල මූලාශ්‍රය වන්නේ ................................... යයි.
(දීපවංශය, මහාවංශය, පොළොන්නරුවේ ගල් විහාරය)

(2) පෘථිවියේ මුලින්ම බිහි වූ ජීවයක් සහිත දෙය ...................................................... නමින් හැඳින්වේ.
(ඔපබීනියා, ප්‍රොකායෝට්, නිහාරිකාව)

(3) පළමු වරට මුවහත් මුහුණතක් සහිත මෙවලමක් සාදනු ලැබුවේ. .................................................. මානවයා විසිනි.
(හෝමෝ හැබිලස්, හෝමෝසේපියන්, හෝමෝ නියැන්ඩතාල්)

(4) මාලිමා යන්ත්‍රය, මුද්‍රණ යන්ත්‍රය ආදිය මුලින්ම ලෝකයාට හඳුන්වා දෙන ලද්දේ ....................................... ජාතිකයන් ය.
(අරාබි, මෙසපොතේමියානු, චීන)

(5) දේවානම් පියතිස්ස රජතුමා විසින් ..................................................... උයන මිහිඳු මහ රහතන් වහන්සේට පූජා කරන ලදී.
(රන්මසු, මහමෙවුනා, සීගිරි)

❖ අංක 6 -- 10 දක්වා ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් ( ✗ ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(6) මිනිස් ඇටසැකිලි පුරාවිද්‍යාත්මක සාධකයන්ට ගැනේ. (      )

(7) ශක වර්ෂ ක්‍රමය ආරම්භ කරන ලද්දේ ඉන්දියාවේ විසූ ගෞතමී පුත්‍ර සාතකර්ණී රජු විසිනි. (      )

(8) පුරා ශිලා යුගයේ දී මිනිසුන් විසින් ගොවිතැන හා සත්ව පාලනය ආරම්භ කරන ලදී. (      )

(9) විජය කුමරු ශ්‍රී ලංකාවට ගොඩබැස ජනාවාස ඇතිකරගන්නා තුරු මෙරට ජන කොට්ඨාසයක් ජීවත් නොවිණි. (      )

(10) මෙරට වැසියන් අතීතයේදී මියගිය ඥාතීන්ට අවමංගල්‍ය චාරිත්‍ර ඉටුකර ඇත. (      )

❖ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) පොළොන්නරුව ගල් විහාරය ඉදිකරවන ලද රජතුමා වූයේ මොහුය.
(i) දුටුගැමුණු රජු (ii) විජයබාහු රජු (iii) මහා පරාක්‍රමබාහු රජු (iv) මහසෙන් රජු



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(12) මෙසපොතේමියානු ශිෂ්ඨාචාරය දෙගම්මැදි රාජ්‍ය ලෙස ද හැඳින්වේ. එම ශිෂ්ටාචාරය පිහිටියේ මෙම ගංගා දෙක අතර ය.
(i) සින්දු හා ගංගා නම් ගඟ (ii) නයිල් හා නයිජීර් ගඟ
(iii) යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගඟ (iv) නයිල් හා යුප්‍රටීස් ගඟ

(13) කූන්‍ය අක්ෂරයෙන් ලියන ලද ලෝකයේ පැරණි වීර කාව්‍යයෙහි සඳහන් වන්නේ මෙම රජතුමා ගැනය.
(i) අක්හෙනතන් (ii) ගිල්ග - මේෂ් (iii) හමුරාබි (iv) ටූටන්කාමන්

(14) දඩයක්කරුවන් විසින් නිර්මාණය කළ බෙලිකටුවකින් සාදන ලද තැල්ල හමුවී ඇත්තේ මින් කුමන ස්ථානයෙන් ද?
(i) බෙල්ලන් බැඳි පැලැස්ස (ii) බටදොඹ ලෙන
(iii) පාහියන්ගල ලෙන (iv) බෙලිලෙන

(15) මහාවංශයෙහි සඳහන් පරිදි විජය කුමරු ඇතුළු පිරිස ජනාවාස පිහිටුවන ලද්දේ මෙම ගංගාව ආශ්‍රිතවය.
(i) දැදුරු ඔය (ii) මල්වතු ඔය (iii) මී ඔය (iv) ගල් ඔය

❖ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

(16) වානරයකුව සිට ........................................................................ නමින් හැඳින්වෙන බුද්ධිමත් මිනිසා පරිසරවල පැවති වෙනස්කම් අනුව වර්ග හතරකට බෙදා ඇත.

(17) මිනිසා විසින් පළමුවරට ගින්දර සොයාගත් බවට සාක්ෂි .................................................... න් සොයාගෙන තිබේ.

(18) මෙසපොතේමියාවේ උතුරු කොටසේ ජීවත් වූ ................................................................වරු දක්ෂ වෙළෙන්දෝ වූ හ.

(19) ධොලවීර හා කාලිබන්ගන් නගර අයත් වූයේ ...................................................... ශිෂ්ඨාචාරයටයි.

(20) නීග්‍රොයිඩ් ජනවර්ගය ජීවත් වූයේ .................................................................... වෙහි ය.

(ලකුණු 2 x 20 = 40 )



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.c

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- ❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) (i) ඉතිහාසය හැදෑරීමේ දී ප්‍රයෝජනවත් මූලාශ්‍ර වර්ග දෙකකි. ඒවා නම් කරන්න. (ලකුණු 2)

(ii) කාලය මැනීමේදී සුලබව යොදාගන්නා ක්‍රි.පූ. හා ක්‍රි.ව. වලට අමතරව ඇති ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 2)

(iii) 1. මෙරට විධිමත් පාලන ක්‍රමයක් ආරම්භ කළ රජතුමා කවුද?

2. සාමාන්‍ය වැසියන් මින්නේරි දෙවියන් ලෙස හැඳින්වූ රජතුමා කවුද? (ලකුණු 2)

(iv) 1. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2. මෙය නිර්මාණය වීම කෙසේ සිදුවී දැයි ලියන්න. (ලකුණු 2)



(v) 1. මෙම පින්තූරය හඳුනාගෙන නම් කරන්න.

2. මෙය හමු වී ඇත්තේ කුමන රටකින් ද? (ලකුණු 2)



(vi) නව ශිලා යුගයේදී ගොවිතැනට හුරු වූ මිනිසා වගා කළ ධාන්‍ය වර්ග 3ක් ඇසුරින් වගුව පුරවන්න.

| ප්‍රදේශය | වගා කළ ධාන්‍ය |
|---|---|
| මධ්‍යම මෙක්සිකෝව | ................................. |
| මධ්‍යධරණී ප්‍රදේශය | ................................. |
| චීනය | ................................. |

(ලකුණු 6)

(02) (i) පූර්ව ශිලා යුගයේ මිනිසුන්ගේ ජීවන ක්‍රමයේ ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 3)

(ii) පූර්ව ශිලා යුගයට වඩා මධ්‍ය ශිලා යුගයේදී සිදුවූ වෙනස්කම් 2ක් ලියන්න. (ලකුණු 4)

(iii) නව ශිලා යුගයේදී මිනිසාගේ දියුණුවට බලපෑ වැදගත් කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(03) (i) පහත රූප සටහන් වලින් දැක්වෙන දෑ නම් කරන්න. (ලකුණු 3)

(1)



.................................

(2)



.................................

(3)



.................................


(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර හතර නම් කරන්න. (ලකුණු 4)

(iii) මෙසපොතේමියානු ශිෂ්ටචාරයේ සමාජය බෙදී තිබුණ කොටස් හතර නම් කරන්න. (ලකුණු 4)



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.

(04) (i) දී ඇති ලෝක සිතියමෙහි අංක 1,2,3 යටතේ ඇති ශිෂ්ටාචාර නම් කරන්න. (ලකුණු 3)




(ii) 1. අංක තුනෙන් දැක්වෙන ශිෂ්ටාචාරය පිහිටි මහාද්වීපය කුමක්ද? (ලකුණු 2)
2. එම ශිෂ්ටාචාරය පිහිටියේ කුමන ගංගා නිම්නයේද? (ලකුණු 2)
3. මෙම ශිෂ්ටාචාරයේ පාලකයන් හැඳින්වූ නම කුමක්ද? (ලකුණු 2)
4. මෙම ශිෂ්ටාචාරයේ පිරමීඩ සකස් කර ඇත්තේ කුමක් සඳහා ද? (ලකුණු 2)

(05) (i) පැරණි ශිෂ්ටාචාර ඇසුරින් දක්වා ඇති පහත පින්තූර හඳුනාගෙන නම් කරන්න.

(1)

(ලකුණු 1)

(2)

(ලකුණු 1)

(3)

(ලකුණු 1)

(ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ පූජක වරුන්ගේ ලක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 4)

(iii) පැරණි ශිෂ්ටාචාර ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ස්මාරකය | ශිෂ්ටාචාරය |
|---|---|
| කුනාෘ අක්ෂර<br>සත්ත්ව සංකේත සහිත මැටි මුද්‍රා<br>සෙල්ලම් මැටි කරත්තය<br>පිරමීඩ | |

(ලකුණු 4)

(06) (i) මුලින්ම මෙරටට පැමිණියවුන් දඩයමින් සිය ජීවිකාව ගෙන ගියහ. ඔවුහු භාවිතා කළ ආයුධ නිර්මාණය සඳහා යොදාගත් අමුද්‍රව්‍ය තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) ආදී මානවයා තම ආහාරය සඳහා යොදාගත් සත්ත්ව වර්ග 4ක් ලියන්න. (ලකුණු 4)

(iii) ගල් යුගයේ විසූවන් තම මියගිය ඥාතීන් සම්බන්ධයෙන් අනුගමනය කළ චාරිත්‍ර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(7) (i) 1. මෙරට පැරණිතම ජනතාව ජීවත් වූයේ කුමන ප්‍රදේශවල ද? (ලකුණු 1)
2. එම ප්‍රදේශ කුමන නමකින් හැඳින්වූයේ ද? (ලකුණු 1)
3. ඔවුන් ධාන්‍ය ආහාරයට ගත් බවට ලැබී ඇති සාක්ෂිය කුමක්ද? (ලකුණු 1)

(ii) වරිච්චි ගෙයක් සෑදීමට උපයෝගි කරගන්නා අමුද්‍රව්‍ය 4ක් ලියන්න. (ලකුණු 4)

(iii) හේන් ගොවිතැන සඳහා යොදාගන්නා ධාන්‍ය වර්ග 4ක් ලියන්න. (ලකුණු 4)



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 6 - 2017

### ඉතිහාසය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| (1) - පොළොන්නරුවේ ගල් විහාරය | (6) ( ✔ ) | (11) මහා පරාක්‍රමබාහු රජු | (16) හෝමෝසේපියන් |
| (2) - ප්‍රොකායෝටි | (7) ( ✔ ) | (12) යුප්‍රටීස්, ටයිග්‍රීස් | (17) ඊශ්‍රායලයෙන් |
| (3) - හෝමෝහැබිලස් | (8) ( ✘ ) | (13) ගිල්ග - මේෂ් | (18) ඇසිරියන්වරු |
| (4) - චීන | (9) ( ✘ ) | (14) පාහියන්ගල ලෙන | (19) ඉන්දු නිම්න |
| (5) - මහමෙව්නා | (10) ( ✔ ) | (15) මල්වතු ඔය | (20) අප්‍රිකා |

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

(1) (i) සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය

(ii) 1. ශක වර්ෂ
2. හිජ්රි වර්ෂ

(iii) 1. පණ්ඩුකාභය රජතුමා
2. මහසෙන් රජතුමා

(iv) 1. නිහාරිකාවක්
2. අහසෙහි තිබූ දූවිලි වළාවකින්

(v) ඊජිප්තු චිත්‍රාක්ෂර ,ඊජිප්තුව

(vi) 1. බඩ ඉරිඟු
2. තිරිඟු
3. වී

(2) (i) 1. කණ්ඩායම් ලෙස තැන තැන ඇවිදිමින් ජීවත්වීම.
2. මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල්‍ය චාරිත්‍ර ඉටුකිරීම.
3. දඩයම සහ ආහාර එකතු කරමින් ජීවත් විය.

(ii)
- දුනු ඊතල භාවිතා කිරීම.
- තැනින් තැන ඇවිදීම වෙනුවට එකතැන රැඳී සිටීම.
- ගල්, පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම.

(iii)
- ගොවිතැනට පුරුදු වීම හා සතුන් හීලෑ කරගැනීම නිසා සත්ව පාලනයට හුරු වීම.
- ලෝහ මෙවලම් සකස් කරගැනීම.
- ගම්මානවල ජීවත් වීමට හුරුවීම.
- දුප්පත් පොහොසත් බෙදීමක් මුල් වරට ඇතිවීම.

(3) (i) 1. මෙසපොතේමියානු අක්ෂර පද්ධතිය
2. ඉන්දු නිම්න මුද්‍රාවක්.
3. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සෙල්ලම් කරත්තය.

(ii) මොහෙන්දෝජාරෝ, හරප්පා, ධොලවීර, කාලිබන්ගන්

(iii) 1. පූජකයන්
2. ඉහළ පන්තිවලට අයත් වැසියන්.
3. පහළ පන්තිවලට අයත් වැසියන්
4. වහලුන්.

(4) (i) 1. මෙසපොතේමියානු
2. ඉන්දු නිම්න
3. ඊජිප්තු

(ii) 1. අප්‍රිකාව 2. නයිල් 3. පාරාවෝ
4. රජවරුන්ගේ මිනී තැන්පත් කිරීමට

(5) (i) 1. නෙෆර්ටිටි රැජිනිය
2. මමිය
3. ටූටන්කාමන් රජුගේ මමියේ මුහුණත ඇති වෙස් මුහුණ

(ii) හිස මුඩු කිරීම, බලවත්ම පිරිස වීම, බැටළු සම්වලින් මැසූ කබා ඇඳීම, ආගමික කටයුතු වලට අමතරව වෛද්‍යවරු ලෙස කටයුතු කිරීම. (මින් 2 ක්)



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.

**Answer**

(iii) 1. මෙසපොතේමියාව
2. ඉන්දුනිම්නය.
3. ඉන්දුනිම්නය.
4. ඊජිප්තු

(6) (i) ගල්, ලී, සත්ත්ව ඇටකටු

(ii) මුවන්, හාවුන්, දඬුලේනා, ඉත්තෑවා, ඉබ්බා, මීමින්නා, තලගොයා, ගොළු බෙල්ලා

(iii) මිනී වකුටු කොට වළලා තැබීම, ඇටසැකිලි මත වර්ණ ආලේප කිරීම (ගුරුගල්)

(7) (i) 1. කඳුකර ප්‍රදේශවල තැනින් තැන පිහිටි තැනිතලා බිම්වල
2. සානු
3. ඔවුන් ජීවත් වූ තැන්වලින් ධාන්‍ය ඇඹරීමට ගන්නා ගල් හමුවී තිබීම.

(ii) ලී, වැල්, මැටි, ඉලුක්, මානා ආදිය.

(iii) මුං, තල, මෑ, කව්පි, උඳු ආදිය.

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ දේ PDF ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..



iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.com iskolee.